


# කතුවර සටහන

අම්මා සිංහල විෂය ඉගැන්වූ ගුරුමාතාවකි. එතුමිය ප්‍රාථමික පන්තිවලට චිත්‍රකර්මය ද ඉගැන්වූවා ය. තාත්තා ඒ පාසලේ ම සංගීතාචාර්යවරයායි. එතුමා ඉඳහිට කවි, ගී පද රචනා කළේ ය. ඒ පාසලේත්, ගම්මුන්ගේත් අවශ්‍යතාවලටයි.

අගනුවර දී මෙළොව එළිය දුටුව ද අප පදිංචිව සිටියේ සීතාවක රාජධානියේ අවිස්සාවේල්ලේයි. අප හැමොගේ ම මුල් පාසල අවිස්සාවේල්ලේ සීතාවක මහා විද්‍යාලයයි.

නව වැනි විය පිරුණු දා අපගේ දෙමව්පියන් අවිස්සාවේල්ලේ "ඉම්පීරියල්" සිනමාහලේ ප්‍රදර්ශනය වූ "කළණ මිතුරෝ" සිනමාපටය නැරඹීමට අපව කැඳවාගෙන ගියේ, එය වෙහෙසී ඉගෙන ගන්නා මිතුරන් දෙපළකගේ ආදර්ශවත් කතාවක් වූ නිසයි. එහි වූ පසුබිම් ගී පහක් ම ගායනා කළේ "වික්ටර් රත්නායක" නම් වූ යොවුන් ගායන ශිල්පියායි. එකිනෙකට වෙනස්ව මේ ගී තනු සහ සංගීතය නිර්මාණය කළේ ෂෙල්ටන් ප්‍රේමරත්න සංගීතවේදියා යි. එදා ඒ ගී රසයෙන් ලද ආහ්ලාදයෙන් "වික්ටර් ගී උන්මත්තකයෙකු" බවට පත්ව මෙතෙක් ආ ඒ වින්දනීය දිවිය පිළිබඳව අතීතාවලෝකනයයි මේ.

අටවන ශ්‍රේණියට සමත් වූවා පමණකි! පියාණන් අප අතරින් අකාලයේ වියෝ විය. ශිෂ්‍යත්ව වරමින් ඒ වන විට කොළඹ ආනන්ද විද්‍යාලයට ඇතුලත්ව සිටි අප නවාතැන් ගෙන සිටියේ කිරුලපණ ප්‍රදේශයේ ඥාති නිවෙසකයි. අපගේ "වික්ටර් උන්මාදය" මුහුකුරා යාමට කදිම පරිසරයකි, ඒ නවාතැනේ වූයේ. ජස්ටින් ජයසුන්දර, අපගේ ඥාති සොයුරා, මුල්වරට "ස" ප්‍රසංගය නැරඹීමට අපව කැඳවාගෙන ගියේ ඒ වසර මුලදී සිදු වූ පියාණන්ගේ වියෝවෙන් දුකට පත් අපගේ සිත සනහාලන්නට විය හැකියි. වික්ටර් ගී රසිකයෙකු වූ "ජෙස්ටින් අයියා" ගුවන්විදුලියේ පටිගත කෙරුණ "ආරාධනා", "වාසනා උදාව" වැනි වැඩසටහන් නැරඹීමට යාමට ද සිය සගයන් ඇසුරෙන් ඉඩ කඩ ලබා ගත්තේ, අපව ද කැටුව යාමට අමතක නො කළේ ය. පාසල අවසන් ව නවාතැනට ආ විගස ගුවන්විදුලියේ "කාන්තා ඉල්ලීම් තීරයට" සවන් දීම පුරුද්දක් වූයේ "වික්ටර්ගේ සින්දුවක්" ඒ තුළින් අනිවාර්යයෙන් ම ප්‍රචාරය වූ නිසයි. ගුවන්විදුලියේ ස්වදේශීය සේවයේ රාත්‍රී කාලයේ ප්‍රචාරය වූ වික්ටර් රත්නායකයන්ගේ පැයක සංගීත පාඩමට පිරිස ම එක්ව සවන් දුන්නේ "මුවන්පැලැස්ස" නාට්‍යයට සවන් දුන්නාට නො දෙවෙනි වූ උනන්දුවකින්. සයවන පන්තියේ එකට සිට මිතුරෙකු වසර හතලිස් දෙකකට පසුව අපගේ විදුලි තැපැල් ලිපිනය සොයා ගනිමින් ලියා එවන්නේ;

"I suppose you are married to a බින්දුමතී now!" යනුවෙන්.

වික්ටර් උන්මාදය අපව බොහෝ ඉසව් කරා යොමු කරවීය. සති අන්තවල අවිස්සාවේල්ලේ "වීණා ශ්‍රී" නිවහනේ ගිගුම් දුන් අපගේ ඒක පුද්ගල ප්‍රසංගය පවුලේ උදවියට "කන්දොස්කිරියාවක්" බවට පත් වූයේ වික්ටර්ගේ සින්දු කිව්වේ වික්ටර් ම නොවූ නිසායි; "කියවීමක්" මිස, ඒ "ගායනයක් " ම නොවූ නිසයි. "ස" ප්‍රසංග පෝස්ටර් ගැලවීමට රෑ පුරා නිදි වරමින් අගනුවර වීදිවල සගයින් සමඟ සැරුවේ, ඇලවූ විගස ගැලවීමේ දී හානියක් නොවී රැස්කරගත් පෝස්ටර් එකතුවක් වෙනුවෙන්. විටෙක ගලවන්නන් අලවන්නන්ගෙන් පහර නොකා බේරුණේ දෙපාවලටත්, රෑ අඳුරටත් පින් සිදුවන්නටයි. පාසල අවට වූ මුද්‍රණාලවල සේවකයින් දුර තියා අප දුටුවන ම "ස" පෝස්ටර් නම් ඔක්කොම ඉවරයිනෙ මල්ලි" යැයි පැවසූවේ අප ඒ පිළිබඳව විමසීමටත් පෙරයි. "ස" 50 ප්‍රසංගයේ පෝස්ටරයට රුපියල් සීයක් ගෙවා මිළදී ගැනීමට සඟයෙකු ඉදිරිපත් වුණ ද අප නො වේ, ඊට එකඟ වූයේ. එදා රුපියල් සීයය අද ඩොලර් සියකටත් වඩා වටිනා විය. කේශ කලාපය වැවීමට පෙර ගන්නා ලද වික්ටර් රත්නායකගේ එහි වූ ඡායාරූපය අප අතින් ආලේඛ්‍ය සිතුවමකට එදා නැංවිණ. පෝස්ටර්වල වූ තාම්පුරාවක් වයනා යුවතිය අදටත් මෙල්බන් ප්‍රජා ප්‍රකාශනයක් වන "සත්නස" මාසිකයේ "ගී සඳළුව" ලිපියේ ලාංඡනයයි. ආලේඛ්‍ය සිතුවමින් ලිපිය සරසන ආලේඛ්‍ය සිතුවම් කලාවේ ඇරඹුම "වික්ටර්ගේ පින්තූර" ඇඳීමට ගත් උත්සාහයයි.

ආනන්ද විද්‍යාලීය ශිෂ්‍යභට තූර්යවාදක කණ්ඩායමට බැඳීමේ අභිලාෂයෙන් බටනලාව වැයීමට අපගේ උනන්දුව හඳුනාගත් මව සංගීත ගුරුවරයෙකු වෙත අපව යොමු කරවූවාය. ශාස්ත්‍රීය රාගධාරී ස්වර සටහන් වැයුම් අතරේ සවනට ඇසෙන ලෙසින් "තොටුපොළ අයියේ", "පොඩි කුමාරි හාමියේ" වැයුමට ගත් අහිංසක උත්සාහය සිහිපත් වේ. ගමන් පා රිද්මයට ගැලපෙන සේ "වික්ටර්ගේ සින්දු" තූර්යවාදක කණ්ඩායමේ බටනලා අතරින් පවනට පසු කලෙක මුසු විය. විදෙස් ගතවන තුරු ම ආදී ආනන්දීයකු ලෙසින් සිසු දරුවන්ට බටනලාව හුරු කරවූයේ ඒ අතීතකාමුක ආහ්ලාදයෙන් ම යි.

පිටු හතළිහේ, අසූවේ කොපි පොත් පාඩම් සටහන්වලින් පිරී යද්දී, පිටු දෙසීයේ මොනිටර් ඇක්සයිස් පොත් වික්ටර්ගේ ගී පදරචනාවලින් පිරී ගියේ රචකයින්ගේ නම් ද ඇතුළත්වයි. ආනන්ද විද්‍යාලයේ "අනඳ නුවණ" සංගමයේ සංස්කාරකවරයා ලෙසින් වසර ගණනාවක් තිස්සේ දැන්වීම් පුවරු හා බිත්ති පුවත්පත් සඳහා අඳිමින් හා කවි පබඳිමින් ලබාගත් සමකාලීන ආනන්දීයයන්ගේ ආකර්ශනය ගී පද රචනා කිරීමට අපව උනන්දු කරවාලීය. සංගමයේ මාසිකව පැවත් වූ "නුවණ දිනයේ" තේමා ගීතය ලෙස "කොහේද කොහේ ද අපේ ලොවක්" ගීතය තෝරාගෙන ගැයෙද්දී "මඩොල් දූව" සිනමාපටයේ උපාලි ගිනිවැල්ලගේට රඟ පෑ රංගන ශිල්පියා ද අප අතර විය. සමරු පොත් පුරා පිරී ගියේ "වික්ටර්ගේ සින්දුයි". පාසලේ රැස්වීමේ දී "මෝහෙන් මුළා වෙලා" ගීය ගැයුමෙන් පසු ගරුතර ස්වාමීන්වහන්සේගේ දේශනය ද ඒ අනුව වෙනස් විය. ශිෂ්‍යයින්ගේ ඉදිරිපත් කිරීම්වලින් පසුවයි අනුශාසනාව පැවැත්වීමට යෙදුණේ.

ආනන්දයේ දී ලියූ කවි නැවත පද රචනා මෙන් ලියා අපගේ ආදරය දිනූ ප්‍රවීණයන්ට තැපැල් කර හරිමින් ගත් උත්සාහයේ එක් පළයක් වූයේ සුනිල් එදිරිසිංහයන් ගී ක්ෂේත්‍රයේ මුල් ම හිතවතා බවට පත්වීමයි.

රසිකයෙකු ලෙස උන්මාදයෙන් ඇදහූ වික්ටර් රත්නායකයන්ගේ මිහිරි තනුවකින්, සංගීතයෙන් සහ මධුර හඬින් රචකයෙකු ලෙස නො දැනුවත්ව ම අප දොරට වැඩ ඇති සුභාරංචිය අපට පැවසූවේ සුනිල් එදිරිසිංහයන්. කිසිඳු දැනහැඳුනුම්කමකින් තොර ව වූ මේ දොරට වැඩීම දෛවෝපගත සිදුවීමක් නොවේ ද? වික්ටර් රත්නායක හඬ ගැබින් මෙලොව එළි දුටු ඒ සුජාත කුළුඳුල් දරුවාගේ මුහුණුවර අපට ඇසීමට ගෙන හැර පෑයේ ගීතනාත් කුඩලිගම සොයුරායි. ඒ "හත් ද නව ද" ගීයයි. වික්ටර් රත්නායක, "ස-විචිත්‍ර" නිවහෙන්දී සුනිල් එදිරිසිංහයන් අපව වික්ටර් රත්නායකයන්ට හඳුන්වාදීමෙන් අනතුරුවයි ඒ. හෙළ ගීයේ මහ ගෙදර වන ගුවන්විදුලියෙන් බිහි වූ ගී පද රචකයෙකු බවට ඒ වන විටත් පත්ව සිටි අපගේ තව පද පෙළක් දෙවන ගීතය බවට පත් වී තිබිණ. එදා මෙදා තුර විසි

වසරක ගී නිමැවුම් ගනුදෙනුවේ පළයයි "සිදංගනා" සංගත තැටිය. එදා මෙදා තුර වසර හතළිස් පහක් තිස්සේ විඳි රසික වින්දනයේ පළයයි "වික්ටර් ගී විමංසා".

"වික්ටර් ගී විමංසාවේ" දී සිහිපත් කළ යුතු වන පිරිස් බොහෝ ම යි.

එ දවස ගුවන්විදුලියෙන් ප්‍රචාරය වන ආචාර්ය වික්ටර් රත්නායකයන්ගේ ගීත සැනෙකින් අප ලියා ගත්තේ ආදරණීය පියාණන්ගේ අත් අකුරට හුරු කටු අකුරෙනි. අපගේ කුඩා සුරතට ගල්කුරක් දී, අතින් අල්ලා දහ-සියක් වාරයක් ගල් ලෑල්ල මත තමන්ගේ වටකුරු අත් අකුරු හුරු කරවූ සඳාදරණීය මවට පින්සිදු වන්නට ඒ කටු අකුරින් ලියා ගත් ගී වට අකුරින් ඇක්සයිස් පොත්වල පිළිවෙළකට ලිවූවෙමු. තමන් සතු සියළු වින්දන හා කුසලතා ශක්තීන් ජානගත කරවා අප හට පිදූ ඒ දිසානායක ආරච්චිලාගේ ගාමිණී ප්‍රේමතිලක පියාණන්වත්, එච්.ආර්. කරුණා සාදිමැණිකේ මාතාවත් මුලින් ම සිහිපත් කරන්නේ පින් අනුමෝදන් කරවමිනි.

කැළණි හා සීතාවක නදී නිම්නයන්හි මනෝරම්‍ය වූ වටපිටාවක සොඳුරු මතක මනස් සෛලගත කරවූ අවිස්සාවේල්ල ගම් පියසත්, අභිමානනීය සීතාවක රාජධානියේ සීතාවක මහා විදුහල් මාතාවත් සැමදාමත් ඒ මනෝභාවයන් කරා අපව මෙහෙයවයි.

අපට අකුරු කියැවූ සාර්ලිස් අමරසිරි විශ්‍රාමික විදුහල්පතිතුමාණෝ අපගේ ගුරු පරපුරෙහි මුල් තැන්හි වැඩ සිටිමින් අදටත් අපහට පූර්වාදර්ශ ලබා දෙන්නෝ ය. අපගේ ප්‍රාථමික පාසල් අවධියේ මුල් ම ගුරුතුමිය වූයේත් අපගේ මව ම යි. සිංහල බස විෂයයක් ලෙස උගන්වමින් අප මතකයේ සඳාදරණීය මතකයන් එක්කළ ගුරු භවතුන් අතරින් ආනන්ද විද්‍යාලයේ ඉගැන්වූ කේ.එල්. පෙරේරා ගුරුමාතාවත්, එච්.ජී. ධර්මදාස ගුරු පියාණන්වත් නිතර සිහිපත් වෙයි. බටනලාව වැයීමට හුරු කරවූ අමරසිරි බණ්ඩාර සංගීත ගුරු පරීක්ෂකවරයාත්, ගැයුම හුරු කරවූ මෙල්බන් නුවර වාසනා වීරකෝන් මහත්මියත් මෙහිදී සිහිපත් වේ. වාසනා වීරකෝන් මහත්මිය මෙන්ම සංගීතාචාර්යවරියක වන විශාරද ගෝපිකා ලියනගේ, අපගේ බාල නැඟනිය ද පොත පත ළංකර දීමෙන් දැක්වූ සහය අගය කළ යුතු වෙයි. ලේක්හවුස් ආයතනයේ "සිළුමිණ" පුවත්පතේ ව්‍යාපාර කතුවරිය වන සාගරිකා දිසානායක ජයසිංහ, අපගේ වැඩිමල් නැගනියත්, ආර්.ජී. නන්දාවතී ඥාති සොයුරියත් මව්බිමේ සිට දෙන්නා වූ දිරි දීම් මේ සද්කාර්යයට පමණක් සීමා නො වේ. වික්ටර් රත්නායකයන්ගේ නිර්මාණ විඳීමට රුකුල් දුන් ජස්ටින් ජයසුන්දර ඥාති සොයුරාණන්වද පින් පමුණුවමින් සිහිපත් කළ යුතු වේ.

ආනන්ද විද්‍යාලය නිර්මාණකරුවන්ට තෝතැන්නක් වූයේ අනාදිමත් කාලය පටන්. මහාචාර්ය ජේ.බී. දිසානායක, දයානන්ද ගුණවර්ධන, ඩෝල්ටන් අල්විස්, විමල් අබයසුන්දර, බණ්ඩාර කේ. විජේතුංග, මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර, ප්‍රේමකීර්ති ද අල්විස්, කුලරත්න ආරියවංශ, මෛත්‍රී පනාගොඩ, ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර, ධම්මික බණ්ඩාර, ආනන්ද පද්මසිරි, දිලීප අබේසේකර, ගාමින්ද ප්‍රියවිරාජ්, නුවන් කුමාර කටුගම්පල, වැනි ගී පද නිබන්ධක පරපුරක අභිමානය අප හට මහත් ධෛර්යයක් වේය සදාකාලිකව ම. ආචාර්ය වික්ටර් රත්නායකයන්ගේ නිර්මාණාවලියටත් "ස" පුරාවතටත් ආනන්දයේ ආනන්දය නො මදව ලැබිණ. අපගේ නිර්මාණ ශීලිත්වය ඉහල නැංවූ පාසලයි ආනන්දය.

වික්ටර් ගී උන්මාදය අප කෙරෙහි නැංවීමට දායක වූ සියළු ගී පද රචකයින්, අනෙකුත් සංගීතවේදීන්, සහය ගායන ශිල්පීන්, වාදන ශිල්පීන්, පටිග කිරීමේ ශිල්පීන්, ශබ්ද පරිපාලකවරුන්, කැසට්පට හා සංගත තැටි නිෂ්පාදකවරුන්, ග්‍රන්ථ කතෘවරුන්, සිනමා, නාට්‍ය හා ටෙලි නාට්‍ය අධ්‍යක්ෂවරුන් මෙහිලා සිහිපත් කරන්නේ, ඔවුන් පිළිබඳව නාමිකව සටහන් තැබීමට ඇති නො හැකියාව පිළිබඳව කණගාටුවෙමින්. මුල්වරට කොට කලිසමකින් සැරසීගෙන පාසල් සිසුවකුලෙස "ස" ප්‍රසංගය නැරඹූ අප යොවුන් රසිකයෙකු ලෙස, පෙම්වතිය සමඟ පෙම්වතා ලෙස , කුළුදුල් දරුවා කුසින් දරාගත් බිරිඳකගේ සැමියා ලෙස, දරුවන් සමඟ ඔවුනගේ පියා ලෙස "ස" ප්‍රසංගය අනේක වාරයක් නැරඹීමට උත්තේජනයක් වූයේ වික්ටර් රත්නායකයන් මෙන්ම රත්නායකයන් පිරිවරාගත්

ඉහත කී පිරිසයි. අවසන "ස" ප්‍රසංගයක් සංවිධානය කළ ප්‍රවීණයන් අට දෙනෙකු අතරට එක් වන්නටත්, දර්ශනගත කළ ප්‍රසංගයේ ප්‍රේක්ෂාගාරයට ඇරයුම් ලබන්නටත් වාසනාව අප ලැබුවේ ඒ සියලු දෙනා මැවූ රසෝසයේ මහිමයෙනි.

වික්ටර් ගී විමංසාවට නිමිත්ත වූයේ මෙල්බන් නුවරදී ආචාර්ය වික්ටර් රත්නායකයන් සමඟ කළ සාකච්ඡාවකි. උදය ගෝවින්න සහෘදයාගේ "තුන්මන්සල" වෙබ් ගුවන් විදුලිය වෙනුවෙන් තමන් ව විමසූ ආකාරය පිළිබඳව බොහෝ සෙයින් පැහැදුන වික්ටර් රත්නායකයන් පවසා සිටියේ එය වඩාත් සංගීත නිර්මාපකයාට සාධාරණය ඉටු වූ විමසුමක් බවයි. එවන් තොරතුරු හා අදහස් කොහේ හෝ ලේඛණ ගත වන්නේනම් එය වඩාත් වටිනා බවයි ඒ වේලේ අපගේ අදහස වූයේ. ආචාර්ය වික්ටර් රත්නායකයන් ඒ වගකීම අප වෙත ම පැවරීම සැබැවින් ම ඒ අගනා නිර්මාණ පෙළහරට අත පෙවීමට රත්නායකයන් අප හට දුන් වරමක් මෙන් විය.

වසර 2005 දී ලද ඒ වරම අනුව ඉදිරියට යාමට මුලින්ම දිරිය ලැබුණේ උදය ගෝවින්න සහෘදයාගෙන් ම යි. ඒ මුළු සාකච්ඡා පෙළට ම සවන් දෙමින් ඒවා ලියා මා වෙත පැවරුවේ මේ උත්සාහයට මුල් අත් පොත් තබමින්. විටින් විට රත්නායකයන්ගේ හඬින් කෙරුණ පටිගත කරගැනීම්වලට රත්නායකයන්ගෙන් ලැබුණු සහයෝගය මෙන් ම රත්නායකයන්ගේ ප්‍රිය බිරිඳ, චිත්‍රාවන්ගෙන් ලද සත්කාර ද ස්තුති පූර්වකව සිහිපත් කරන්නෙමු.

කුඩා කල පාසල් නිවාඩුවේ දි කොහේ හෝ ඇවිදින්නට අපව රැගෙන යාමටත් ආපසු ආ සැනින් ඒ ගමන් බිමන් අළලා රචනා ලියවීමටත් අපගේ පියාණන් දැක් වූ උනන්දුව මේ උත්සාහ වෙනුවෙන් අපව ශක්තිමත් කළ අභ්‍යාසයක් විය. ආදී ආනන්දයියන්ගේ 75-80 කණ්ඩායමේ සංස්කාරකවරයා ලෙස වසර ගණනාවක් තිස්සේ ලද පෙර හුරුව ද මෙහිලා සිහිපත්කළ යුතුයි. පසු කලෙක හඳුනාගත් ජැක්සන් ඇන්තනී ප්‍රවීණ රංගධරයාණන් ලබා දුන් අපූරු අභ්‍යාසයකි වාදනය වන මියැසි හඬ තිරුවට සවන් දෙමින් එවේලේ ම අප හට දැනෙන දේ කාව්‍යමය හෝ ගීතමය ලෙසින් ලිවීම. මේ සඳහා ඔහු එවකට සම්බන්ධව සිටි "සවන" එෆ්.එම්. නාලිකා ශබ්දාගාරයක අප හට ඉඩ කඩ සළසා දුන්නේ ය. මේ අභ්‍යාසය වික්ටර් ගී විමංසාවේදී අතිශයින්ම ප්‍රයෝජනවත් වූ අතර ජැක්සන් ඇන්තනී රංගධරයාණන්ව මෙහිදී සාදරයෙන් සිහිපත් කරන්නෙමු.

ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ දා පටන් දැනට වසර දහ තුනක් තිස්සේ ගීයක් සමාලෝචනය කරමින් මෙල්බන් නුවර අපගේ ප්‍රජා ප්‍රකාශනයක් වන "පහන" මාසිකයට ලියනා "සමවැදුම" ලිපියත්, සන්නස" මාසිකයට වසර දහයක් පුරා ලියනා "ගී සඳළුව" ලිපියත් වික්ටර් ගී විමංසාව ලිවීමට මහත් රුකුලක් විය. ගැඹුරින් කියැවෙන න්‍යායාත්මක කරුණු සරළව ලියමින් "සිහනද" මාසිකයට ලියනා "දියකැටපහන" සිවිල් ඉංජිනේරුමය ලිපි පෙළින් ලද හුරුව වික්ටර් ගී විමංසාවේ මියැසිය පිළිබඳව කරුණු සරළව ලිවීමට ගත් උත්සාහයේදී මහත් පිටිවහලක් විය "පහන" මාසිකයට ලිවීමට ඇරයුම් කළ ජගත් ජේ. එදිරිසිංහ සොහොයුරාත්, එහි වත්මන් කතුවරිය වන මිහිරි දිසානායක මහත්මියත්, "සන්නස" මාසිකයේ කතෘ අසෝක සුබසිංහ සොහොයුරාත්, "සිහනද" කතෘ විල්ප්‍රඩ් සිරිවර්ධන සොහොයුරාත් මෙහිදී සිහිපත් කරන්නේ සෙනෙහසින්.

ලැබුණු අත් පිටපත් සිය ගණනක් අතරින් තරගකාරීව තෝරාගෙන අපගේ "සිසිරගේ කුරුටු ගී" ගී එකතුව ප්‍රකාශයට පත් කළ එස්. ගොඩගේ ප්‍රකාශකයින් ද සිහිපත් කළ යුතුවේ.

සැමදා අප සමග සෙවනැල්ලක් සේ සිටිනා මහේන්ද්‍ර කාලිංගමුදලි පන්ති මිත්‍රයාගෙන් නිරතුරුව ලැබෙන දිරිය මිළ කළ නොහැකියි. අප පිළිබඳව විමසිලිමත් වන ඩෙන්සිල් ජයවීර සොහොයුරාවද සිහිපත් වේ.

"අයියාගේ වීර කාව්‍යයේ වැඩ ඉවරද දැන්?"

තමන් කියැවූ පොත පතේ දැනුම් රසය පැය ගණන් අප හා බෙදා හදා ගන්නා "පොත් ගුල්ලෙකු" වන සුමින්ද නානායක්කාර මල්ලීට අප ස්තුතිවන්ත නො වන්නේ ඔහුගේ නො ඉවසිලිවන්තකම නිසා මයි. පසු ගිය මාස හතර තිස්සේ මා වික්ටර් ගී විමංසා දැහැනින් අවදි වූයේ මහේන්ද්‍රගේත්, සුමින්දගේත් දුරකතන ඇමතුම් හඬින් පමණයි. ඒ ඔවුනගෙන් ලද අස්වැසිල්ල හා මානසික විවේකය නිසා ම යි.

වික්ටර් ගී විමංසාව මෙල්බන් නුවර දී වෙන වෙන ම කියවා අඩු පාඩු පෙන්වා දෙමින් දිරිමත් කළ සම්මානිත මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මියවත්, රාජ්‍ය සම්මානලාභී ප්‍රවීණ ලේඛිකා ස්වර්ණ කාන්ති රාජපක්ෂ මහත්මියවත් ආදරයෙන් සිහිපත් කරන්නෙමු. "පොතක් ලියන්නැ"යි ඉල්ලමින් ඔවුන් දෙපළ අපව දිරිමත් කළේ අද ඊයෙක පටන් නො වේ.

වික්ටර් ගී විමංසාව දස වසරක් තිස්සේ ගත් උත්සාහයක ප්‍රතිඵලයක් වුවද එය නියමාකාරව වගකීමකින් යුක්තව ක්‍රියාවට නැංවුණේ පසුගිය මාස හතරක කාලයේ දීයි. දෙරටක සිට ආචාර්ය වික්ටර් රත්නායකයන් සමඟ දිනපතා ම මෙන් දුරකථනයෙන් සම්බන්ධ වී කරගෙන ආ මේ ගනු දෙනුවේදී වර්තමාන තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයන් භාවිතයෙන් අපව සම්බන්ධීකරණය කළේ හසිනි අමේන්ද්‍රා දියණියයි. ආචාර්ය වික්ටර් රත්නායකයන්ගේ ඥාති දියණියක වන ඇය තමන් නිර්මාණය කරමින් සිටි "www.victorratnayake.lk" සහ "www.victorrathnayake.lk" වෙබ් අඩවිවල වික්ටර් ගී විමංසාවෙන් විමසීමට ලක් වූ ගී වෙනම ම ගොනු කිරීමට අප කළ යෝජනාවට ඉත සිතින් ම එකඟ වූවා ය. "වික්ටර් සින්දු" උන්මාදයෙන් මුලින් ම කැසට් පට මිළදී ගන්නා වකවානුවේ අප නිවසේ කැසට් පට වාදන යන්ත්‍රයක් නො වීය. රත්නායකයන්ගේ ගී එකතුවල රචකයෙකු ලෙසින් සංගත තැටි පිරිනැමෙද්දී ඒවා වාදනය කිරීමට යන්ත්‍රයක් අප වෙත නො වීය. එසේ වුවද අප වෙත වූ "වික්ටර් ගේ සින්දු එකතුව" නම් ඉහළ ගියේ ය. ඒ කෙසේ වුවද මේ උත්සාහයේ දී අප වෙත ද නොවූ ගී ඉල්ලූ සැණින් විදුලි තැපෑලෙන් එවීමට හසිනි දියණිය උත්සුක වූවාය. ඇය අපට ලබා දුන් සහයෝගයට අපගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමු.

අපගේ "නුඹෙ සිරික්කියට" සහ "සිදංගනා" සංගත තැටි වෙනුවෙන් කවර නිර්මාණය කර දෙමින් සහ "අතුරු මිතුරු" සහ "සිනාවී" සංගත තැටි කවර නිසියාකාරව සකස් කර දෙමින් ඉතා නිහතමානීව අප හට සහය දුන් සිසිර විජේතුංගයන් "වික්ටර් ගී විමංසාවේ" කංචුක නිර්මාණයටද දායක විය. විජේතුංගයන්ගේ ඡායාරූපයක් වග නො දැන තෝරාගත් රත්නායකයන්ගේ ඡායාරූපයක් ඇසුරින් අප අතින් සිත්තම් වූ ආලේඛ්‍ය චිත්‍රයක් යොදාගනිමින් ඒ කංචුකය නිර්මාණය කිරීමද අපූර්වත්වයකි. අපගේ නො වක් තුති සිසිර විජේතුංගයන්ටත් හිමි වෙයි.

ගීතයක් යනු බසකත්, මියැසියකත් සංකලනයකි. මේ සංකලනය විමසීමේදී අප අතින් වැරදුණු දේ, මඟ හැරී ගිය දේ පෙන්වා දෙමින් සිය යෝජනා ඉදිරිපත් කළ ලාල් ආනන්ද අබේධීරයන්ට ද හද පිරි ස්තුතිය පළ කරන්නෙමු.

වික්ටර් ගී විමංසාවට අගනා පසු වදනක් ලියමින් අපගේ මේ උත්සාහය මැනැවින් හඳුනාගෙන අගය කළ මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ට ද අපගේ ගෞරවනීය ස්තුතිය පිරිනැමෙයි. ආචාර්ය වික්ටර් රත්නායකයන් හට මුල් යුගයේ පටන් ම ගී පද රචනාවන්ගෙන් මහඟු දායකත්වයක් දුන් අපගේ පූර්වාදර්ශී පෙර ගමන් කරුවෙකි, මහාචාර්ය සුනිල් ආරියරත්නයන්.

පාසල් වියේ පටන් ම දැන හඳුනාගෙන සිටි අපගේ ජ්‍යෙෂ්ඨ ආනන්දයියෙකු මෙන් ම, ජ්‍යෙෂ්ඨ ගී පද නිබන්දකයෙකු ද වන ආචාර්ය ප්‍රණීත් අබේසුන්දරයන්ව අප අදටත් "ප්‍රණීත් අයියා" නමින් අමතන්නේ ඒ දයාබර බව සදා රැඳී ඇති නිසාවෙනි. වික්ටර් ගී විමංසාවට පෙරවදනක් ලියා දෙන මෙන් කළ ගෞරවාන්විත ඉල්ලීමට ප්‍රණීත් අබේසුන්දරයන් දුරකථනය ඔස්සේ දුන් උණුසුම් ප්‍රතිචාරය කිසිදා අමතක නොවේ.

"සිසිර මං අකුරින් අකුරට බලනවා" ආචාර්ය ප්‍රණීත් අබේසුන්දරයන්ගේ සුන්දර බව සඳා රැදෙන්නට "ආනන්දයේ සරණයි!" ලෙසින් පතන්නෙමු, අපි.

වසර දහයක් තිස්සේ දුටු සිහිනය විධිමත්ව, ගුණාත්මකව සහ ප්‍රමිතියකට අනුව සැබෑ කරවීමේ වගකීම භාර ගත්තේ ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ ප්‍රේම් දිසානායක මහත්මායි. දෙරටක දෙයාකාරව කාර්ය බහුල වූ අප අතරේ වූ කතා බහ එක ම අරමුණක් වෙනුවෙන් යොමු වීම මහත් සහනයක් විය. සිය කාර්යාලයේ රැඳෙමින් සෝදු පත් කියැවීමට ලබා දුන් ඉඩ කඩ මෙන් ම සත්කාර ද සිහි කළ යුතු වේ. ප්‍රේම් දිසානායක මහත්මා ඇතුළු කාර්ය මණ්ඩලයට ද අපගේ අවංක ආදර ස්තුතිය හිමිවෙයි.

සෝදුපත් බලනා කාලයේ දී අගනුවර නවාතැන් දෙමින් සත්කාර කළ "සේගීස්" විශ්වවිද්‍යාල ආයතනයේ උප කුලපති, මහාචාර්ය සැම්සන් ඒකනායක ඥාති සොයුරාව ද සිහිපත් වේ.

"නිය පෙළ සිඳලයි" වැනි ගී නිමිත්තක් දායාද කළ පියත් පුතනුවන් අද අපගේ පරිගණක කටයුතුවලදී උපදේශකවරයායි. සරිනි දියණිය මියැසිය තරමක් දුරට හදාරා නිකුත් කළ ඇයගේ "සිනාවී" ගී එකතුවට ආචාර්ය වික්ටර් රත්නායකයන්ගේ නිර්මාණ දෙකක් ද දායක කරගනිමින් අපගේ ගී රචනාවන්ට උපරිම සාධාරණය ඉටු කළාය. ඉංජිනේරු විද්‍යාර්ථියෙකු වන පියත් පුතනුවන්වත් ට්‍රැෆික් ඉංජිනේරුවරියක වන සරිනි දියණියවත් මෙහිදී සිහිපත් කරන්නේ ඔවුන්ගෙන් අප ලබනා සැනසිල්ල, සතුට නො වන්නට මෙවන් බැරෑරුම් කාර්යයකට සිත එකඟ කරගැනීම සිතළුවක් වන නිසයි.

දරු දෙදෙනා හා සබැඳුන අනෙක් ප්‍රධාන භූමිකාව වන්නේ ප්‍රිය බිරිඳ, පද්මායි. පෙම් පුරණා සමයේ දී පෙම්පතක කවියක් ලියා යැව්වද කටු සටහනක් ඇන්ද ද මෙවන් නිර්මාණ කටයුතුවලට ඉංජිනේරුවරයෙකු මැදිහත් වනු ඇතැයි ඉංජිනේරුවරියක වන ඇය එදා සිහිනයකිනුදු නො සිතුවා ය. පසුගිය සිව් මස පුරා කුටියකට වැදී අප ගත කළ මියැසි තවුස් දැහැන ඉවසා සිටීම ම අරුමයකි. මේ සියළු දේ අතරේ පසු ගිය සිව් මස තුළ මතු නොව සඳා අප රැක බලාගනිමින් සෙවනැල්ලක් සේ සිටිනා පද්මාවන් ද මෙහිදි ආදරයෙන් සිහිපත් කරන්නෙමු.

අවසන් වශයෙන් අපගේ සටහනට එක්වන්නේ අපගේ ආදරණීය කතානායකවරයායි. ආචාර්ය වික්ටර් රත්නායකයන් අපගේ වින්දනීය ලොවේ අසම සම ගාන්ධර්වයායි. දිවියට බොහෝ හරයන් මුහු කළ මියැසි අදියුරුවරයායි. අප උගත් සංඛ්‍යානුබද්ධ විද්‍යාවන් මියැසිය හා බැඳුන ද ගණන් - ඉලක්කම් - විද්‍යාවන් අතරේ ම සිරවීමට ඉඩ නො දී සෞන්දර්යයෙන් නැහැවූ වින්දනය අපට ලබා දුන්නේ රත්නායක නිර්මාණයි. ඕනෑ ම විද්‍යාවක් කලාවක් වන්නා සේ ම ඕනෑ ම කලාවක් විද්‍යාවක් ද වන බව පසක් කළේ ඒ වින්දනයයි.

වික්ටර් ගී විමංසාවේදී වසර දහයකටත් වැඩි කලක් අප කළ විමසුම් වෙනුවෙන් ඉවසිලිවන්තව, උනන්දුවෙන් දුන් ප්‍රතිචාර වල අගය කියා නිම කළ නොහැකියි. අන් සියලු දුරකථන සාකච්ඡා නවත්වා අපගේ විමසුම් වෙනුවෙන් කැපවූයේ අප ලියමින් සිටිනා අතරේදී පවා කතා කරනා බව ආචාර්ය වික්ටර් රත්නායකයන් දැන සිටි නිසයි. අපවත්, අපගේ උත්සාහය පිළිබඳවත් නිවැරදි අවබෝධයකින් යුතුව අපව හොඳින් හඳුනාගෙන සිටීම ම අප හට අප්‍රමාණ වූ සහනයක් මෙන් ම දිරියක් විය. වැඩිහිටියෙකු සේ, නිරතුරුව කළ දැනුවත් කිරීම්, උපදෙස්, අවවාද වික්ටර් ගී විමංසාවට පමණක් සීමා නො වීය. වරද දුටු කළ නො පැකිලෙමින් එය පෙන්වා දෙමින් නිවැරදි දේ වෙනුවෙන් අපව යොමු කළ වික්ටර් රත්නායකයන්ගේ නිර්මාණ නිසාවෙන් සිදුවන තවත් දෛවෝපගත සිදුවීම් කිපයක් ම වෙයි.

ආචාර්ය වික්ටර් රත්නායකයන්ගේ මධුර තනුවෙන්, සංගීතයෙන් සහ හඬින් දොරට වැඩි ගී පද රචකයෙකු ම රත්නායකයන්ගේ නිර්මාණ පෙළහර විමසමින් කතුවරයෙකු ලෙසින් ද දොරට

වඩියි. දිය සායමින් සිත්තම් වූ සිය මුල් ම වර්ණ ආලේඛ්‍ය සිතුවම ද ඒ කතුවරයා අතින් ම කංචුකය වෙනුවෙන් නිර්මාණය වෙයි. වසර පනහකට වැඩි කලයක් තිස්සේ ආචාර්ය වික්ටර් රත්නායකයන් ඇසුරේ එළි දුටු සහ ඔපවත් වූ සියළු කලාකරුවන් හා සබැඳි රත්නායකයන් වෙත පිදෙනා ගෞරවනීය ප්‍රණාමය කතුවර සටහන අවසන් කරමින් පුදන්නෙමු.

ඒ ප්‍රණාමය ලැබීමට ආචාර්ය වික්ටර් රත්නායකයන් සදා කල්හි ම හිමිකරුවකු වන්නේ, අඩ සියවසකට වැඩි කලක් තිස්සේ හෙළ ගී කෙතට කළ සරු නිර්මාණ හා ගායනාවන් නිසයි. වික්ටර් නිර්මාණ පෙළක්, වික්ටර් ගැයුම් සමුච්චයක් නො වන්නට වික්ටර් ගී විමංසාවක් ද නො වනු ඇත.

**සිසිර දිසානායක**
2016. 12. 19

“වීණා ශ්‍රී”
අවිස්සාවේල්ල.

25, Allister Street
Mount Waverley,
Victoria 3149,
Australia.
www. sisaaraa.com
Sisira. Dissanyake@gmail.com
0061 400 123 610